පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பராதனைப் பல்கலைக்கழகம்
**UNIVERSITY OF PERADENIYA**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக்கல்வி நிலையம்
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය-2017

(දෙසැම්බර් 2018)

**ඉතිහාසය VII (HG 7)**

**පොදුරාජ්‍ය මණ්ඩලයේ ඉතිහාසය**

කාලය පැය තුන (03) යි.

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මගින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළස (12) කි.

---

**පළමුවන කොටස**

1. එංගලන්තයේ VIII වන හෙන්රි ගේ පාලන අවධියේ වැදගත්කම පිළිබඳ ඓතිහාසික සටහනක් ලියන්න.
2. 1558 - 1603 අතර එලිසබෙත් රැජිණ ගේ පාලන සමය එංගලන්තයේ ස්වර්ණමය අවධිය විය" විමසන්න.
3. 1585-1604 අතර කාලය තුළ සිදු වූ ඉංග්‍රීසි-ස්පාඤ්ඤ යුද්ධයට බලපෑ හේතු පරීක්ෂා කරන්න.
4. උතුරු අමෙරිකාවේ බ්‍රිතාන්‍ය ජනපද පිහිටුවීමේ ක්‍රියාදාමය විචාරාත්මකව සාකච්ඡා කරන්න.

## <u>දෙවන කොටස</u>

5. 17 වන සහ 18 වන සියවස්වල ඉන්දියන් සාගරයේ යටත්විජිත පිහිටුවීමේදී ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමේ භූමිකාව පැහැදිලි කරන්න.

6. 1688 ඉංග්‍රීසි විප්ලවයේ ඓතිහාසික වැදගත්කම පිරික්සන්න.

7. මහා බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය හේතුකොටගෙන ඇතිවූ සමාජ හා දේශපාලන ප්‍රතිඵල කවරේද?

8. "චාර්ටිස්ට් ව්‍යාපාරයේ අරමුණ වූයේ දේශපාලන අයිතීන් ලබාගැනීම සඳහා වැඩකරන පංතියට බලපෑම් කිරීමයි." සාකච්ඡා කරන්න.

## <u>තුන්වන කොටස</u>

9. කැනඩාව තුළ බ්‍රිතාන්‍ය යටත්විජිත ක්‍රියාවලියේ විකාශය පෙන්වාදෙන්න.

10. 1757-1858 අතර කාලය තුළ ඉන්දියානු උපමහද්වීපය තුළ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය පිහිටුවීමේ අදියරයන් විග්‍රහ කරන්න.

11. 1918-1939 අතර කාලය තුළ බ්‍රිතාන්‍ය යටත්විජිත අධිරාජ්‍යය මුහුණදුන් අභියෝග කවරේද?

12. පහත දැක්වෙන මාතෘකා අතරින් <u>**දෙකක්**</u> පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

    (අ) බෝයර් යුද්ධ

    (ආ) වහල් වෙළඳාම තහනම් කිරීම

    (ඇ) ඉන්දියන් සාගරයේ "බ්‍රිතාන්‍ය සාමය"

    (ඈ) වින්ස්ටන් චර්චිල්